# දෙවන වාර පරීක්ෂණය - 2021

# නර්තනය

**07 ශ්‍රේණිය** **පැය - 02 යි**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මණ්ඩියෙහි සම්මත දිග ප්‍රමාණය වන්නේ ,

I. රියනකි. II. මිටි රියනකි.
III. අරමණ්ඩියකි. IV. යාරයකි.

02. ගොඩ සරඹවලට කියනා තවත් නමකි.

I. මණ්ඩි සරඹ II. පා සරඹ
III. අත් සරඹ IV. ඉරට්ටි පද

03. එකතැන සිට කරනු ලබන චලන මේ නමින් හඳුන්වයි.

I. සංචාරි චලන II. රිද්මයානුකූල චලන
III. නම්‍යතා චලන IV. ස්ථිතික චලන

04. ලී කෙලි නැටුමට සමාන ද්‍රවිඩ ජන නැටුමකි.

I. කෝලාට්ටම් II. සෙම්බු
III. සුලකු IV. අරියවෙට්ටි

05. නම්‍යතා අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

I. ශරීරය නම්‍යශීලි වේ. II. කායික හා මානසික සංවර්ධනය
III. දරාගැනීමේ හැකියාව වර්ධනය වේ. IV. සාම්ප්‍රදායික පද නැටීමේ හැකියාව ලැබේ.

06. රබන් පද වාදනය සඳහා සුදුසුම වාද්‍ය භාණ්ඩය මින් කුමක් ද ?

I. විරිඳු රබාන II. අත් රබාන
III. බංකු රබාන IV. බුම්මැඩිය

07. ''සත් වෙත් මහත් අදර - ලත් යුත් සිදත් කුමරු'' මෙම කවි පදය ඇතුළත් වන්නම වන්නේ,

I. හනුමා වන්නම II. තුරංගා වන්නම
III. වෛරෝඩි වන්නම IV. සිංහරාජ වන්නම

08. '' එන්.ඒ. සිරිබෝහාමි '' ගුරුතුමා කුමන නර්තන සම්ප්‍රදායට අයත් ගුරුවරයෙක් ද ?

I. සබරගමු සම්ප්‍රදාය II. උඩරට සම්ප්‍රදාය

III. පහතරට සම්ප්‍රදාය IV. භරත සම්ප්‍රදාය

09. '' ඔවාද සිප්ප දානේන ...... '' මෙය

I. නමස්කාර ගාථාවකි II. ගුරු වන්දනාවයි

III. සිරසපාද කවියකි IV. මල් යහන් කවියකි

10. දේශීය නර්තන සම්ප්‍රදායේ තාල තැබීමට යොදා ගන්නා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

I. ගැටබෙරය II. බුම්මැඩිය

III. තාලම්පට IV. පන්තේරුව

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11. පෙරහැරක පළමු චාරිත්‍රය වන්නේ කප් සිටුවීමයි. (  )

12. බුදු තෙමඟුල සිහි කරනු ලබන්නේ බෞද්ධ ජනයා විසිනි. (  )

13. භාව ප්‍රකාශනයේදී අංග, ප්‍රත්‍යාංග, උපාංග යන කොටස් වැදගත් නොවේ. (  )

14. පා සරඹ සබරගමු සම්ප්‍රදායේදී '' මණ්ඩි පද '' ලෙස හඳුන්වයි. (  )

15. හනුමා වන්නම මාත්‍රා 2 + 2 තාලයට අයත් වේ. (  )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

16. පා සරඹ නැටීමේදී ...................................... භාවිතා කරයි.

17. නර්තනය ආරම්භයේදීත්, අවසානයේදීත් ...................................... නටා ආශිර්වාදය ලබාගනියි.

18. කඩිප්පු දෙකක් භාවිතා කරමින් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය ...................................... වේ.

19. තෛපොංගල් උත්සවයේදී කරන සුවිශේෂී සැරසිල්ලකි ...................................... ඇඳීම.

20. සෑම දරුවෙකුම කුඩා කල රස විඳිනා ගායනා විශේෂයකි ...................................... කවි.

( නමස්කාරය , තම්මැට්ටම , කෝලම් රටා , නැලවිලි , දණ්ඩි කඳ )

( ල : $2 \times 20 = 40$ )

## II කොටස

- ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01. I. දෙතිතේ ප්‍රභේද නම් කරන්න. ( ල : 03 )

II. ''දොං ජිංත ගත දොංත '' යන බෙර පදය අදාල තිතට ප්‍රස්තාර කරන්න. ( ල : 05 )

III. මාත්‍රා 2 + 2 තිතට අයත් කවියක් හෝ රබන් පදයක් ප්‍රස්තාර කරන්න. ( ල : 07 )

02. I. ගැමි නැටුම් යනු මොනවාද ? ( ල : 02 )

II. ගැමි නැටුම් වර්ග 05 ක් ලියන්න. ( ල : 05 )

III. ඉන් දෙකකට අයත් කවි 02 ක් ලියන්න. ( ල : 08 )

03. I. දවුල වාදනය කරනු ලබන අවස්ථා 02 ක් ලියන්න. ( ල : 04 )

II. දවුලක රූප සටහනක් ඇඳ කොටස් 04 ක් නම් කරන්න. ( ල : 11 )

04. I. දේශීය නර්තන සම්ප්‍රදායන් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සම්ප්‍රදාය | ප්‍රචලිත ප්‍රදේශ | ප්‍රධාන ඇඳුම් කට්ටලය | ප්‍රධාන ශාන්ති කර්මය | ප්‍රධාන වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|---|
| උඩරට | I.<br>II. | | | |
| පහතරට | I.<br>II. | | | |
| සබරගමු | I.<br>II. | | | |

( ල : 15 )

05. I. ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් තුනෙහි ශිල්පීය ප්‍රාගුණ්‍ය එළිදැක්වෙන අවස්ථාවන් නම් කරන්න.

- උඩරට නර්තන සම්ප්‍රදාය -
- පහතරට නර්තන සම්ප්‍රදාය -
- සබරගමු නර්තන සම්ප්‍රදාය -

( ල : 2 × 3 = 06 )

II. උඩරට නර්තන සම්ප්‍රදායේ ශිල්පීය ප්‍රාගුණ්‍යය එළි දැක්වෙන අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

( ල : 09 )

06. I. ගොප් ගෙඩියක් නිර්මාණයට අවශ්‍ය අමුද්‍රව්‍ය 02 ක් ලියන්න. ( ල : 04 )

II. ගොප් සැරසිලි භාවිතයට ගන්නා අවස්ථා 03 ක් ලියන්න. ( ල : 06 )

III. ගොප් ගෙඩියක රූප සටහනක් අඳින්න. ( ල : 05 )

07. I. රාමසාන් උත්සවය පවත්වන්නේ කුමන කාලයේද ? ( ල : 03 )

II. රාමසාන් උත්සවය පැවැත්වීමේ හේතු 02 ක් ලියන්න. ( ල : 04 )

III. රාමසාන් උත්සවය තුළින් සමාජයට ගත හැකි ආදර්ශ 04 ක් ලියන්න. ( ල : 08 )

( ල : 15 × 4 = 60 )

## 07 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රිකාව - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | II | (06) | III | (11) | ✓ | (16) | දණ්ඩි කඳ |
| (02) | III | (07) | II | (12) | ✓ | (17) | නමස්කාරය |
| (03) | IV | (08) | I | (13) | × | (18) | තම්මැට්ටම |
| (04) | I | (09) | II | (14) | ✓ | (19) | කෝලම් රටා |
| (05) | IV | (10) | III | (15) | ✓ | (20) | නැලවිලි |

( 2 × 20 = 40 )

## II කොටස

01. I. 2 + 2 දෙතිත
2 + 4 දෙතිත
3 + 4 දෙතිත ( ල : 03 )

II. ''දොං පිංත ගත දොංත '' බෙර පදය මාත්‍රා 2 + 3 ට ප්‍රස්තාර කර තිබීම. ( ල : 05 )

III. මාත්‍රා 2 + 2 තනි තිතට අදාල ඕනෑම කවියක් හෝ රබන් පදයක් ප්‍රස්තාර කර තිබීම. ( ල : 07 )

02. I. ගැමි ජනයා විසින් නිර්මාණය කරගත් නැටුම් ගැමි නැටුම් ලෙස හැඳින්වේ. මෙම නැටුම් තුළින් අතීතයේ විසූ ගැමි ජනතාවගේ සිතුම්, පැතුම්, චර්යා, විශ්වාසයන්, රැකියාවන් යනාදිය හඳුනා ගත හැකිය. මෙම ගැමි නැටුම් අතර විනෝදාස්වාදය පිළිබිඹු කරවන නැටුම් හා ජීවන වෘත්තීන් පිළිබිඹු වන නැටුම් දක්නට ඇත.

( ල : 02 )

II. කල , කුලු , ලී කෙලි , තාලම් , පන් යනාදි ඕනෑම ගැමි නැටුම් 05 ක් ලියා ඇත්නම් ( ල : 05 )

III. ලියා ඇති ගැමි නැටුම් වලට අදාලව කවි දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. ( ල : 08 )

03. I. හේවිසි වාදනය
පෙරහැර සඳහා
සන්නිවේදන කාර්යය සඳහා ( ල : 04 )

II. දවුලක නිවැරදි රූප සටහනක් ඇඳ කොටස් 04 ක් නම් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

( ල : 11 )

04.

| සම්ප්‍රදාය | ප්‍රචලිත ප්‍රදේශ | ප්‍රධාන ඇඳුම් කට්ටලය | ප්‍රධාන ශාන්ති කර්මය | ප්‍රධාන වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|---|
| උඩරට | I. උඩුනුවර<br>II. යටිනුවර<br>III. හේවාහැට<br>IV. හාරිස්පත්තුව | වෙස් ඇඳුම් කට්ටලය | කොහොඹාකංකාරිය | ගැටබෙරය |
| පහතරට | I. ගාල්ල<br>II. මාතර<br>III. බෙන්තර<br>IV. තංගල්ල | තෙල්මේ ඇඳුම් කට්ටලය | දෙවොල් මඩුව | පහතරට බෙරය |
| සබරගමු | I. රත්නපුර<br>II. කුරුවිට<br>III. කලවාන<br>IV. බලංගොඩ | වෙස් ඇඳුම් කට්ටලය | පහන් මඩුව | දවුල |

- එක් උත්තරයකට එක ලකුණ බැගින් දෙන්න. ( ල : 15 )

05. I. උඩරට නර්තන සම්ප්‍රදාය - හිස වෙස් බැඳීමේ මංගල්‍යය

පහතරට නර්තන සම්ප්‍රදාය - මඩු බැසීමේ මංගල්‍යය

සබරගමු නර්තන සම්ප්‍රදාය - ගුරු වරම්දීමේ මංගල්‍යය

( 2 × 3 = 06 )

II.

- ගුරු ගෙදර අධ්‍යාපනය නිමකරන ආධුනිකයා තම ජන්ම පත්‍රයට අනුව සුදුසු වෙලාවක් බලා නියම කරගත් දිනට තෙමසකට කලින් පේ වීම හා ශිල්පය ලබා ගැනීම.

- නැකැත් දිනට ආසන්න දින 07 තුළ ආධුනිකයා විහාරස්ථානයේ ආගමික කටයුතුවල යෙදීම හා සවස් කාලයේ දෙවි දේවතාවුන්ට පහන් පැලක් සකසා පහන් දල්වා ආශිර්වාද ලබා ගැනීම.

- නැකැත් දිනට ප්‍රථම දින රාත්‍රියේ හගල ඇතුළු රංග වස්ත්‍රාභරණ පේ කර බෝධි පූජාවට සහභාගි වීම.

- නැකැත් දින විහාරයට ගොස් සෙත් පිරිත් මැද හිස වෙස් පැලඳවීම.

- ඉන් පසු විහාරයෙන් පිටතට පැමිණ අදාල චාරිත්‍ර සිදුකොට පලතුරු පූජාව සිදු කොට ගුරු පා නැමැද ශිල්ප දැක්වීම.

( ල : 09 )

06. I. ගොප් කොළ

කෙසෙල් බඩ

ඉරටු

පිහියක් ( ල : 2 × 2 = 04 )

II. තොවිල් - පවිල් වලට

පිරිත් මණ්ඩපයට

තොරණට

මඟුලට ( ල : 2 × 3 = 06 )

III. නිවැරදි රූප සටහන ඇඳ ඇත්නම් ලකුණු දෙන්න. ( ල : 05 )

07. I. ජූනි මස පොහොය දින සිට ජූලි මාසයේ පොහොය දක්වා ලෙස පොත පතෙහි සඳහන්ව ඇත. නමුත් මෙය වෙනස් වන අවස්ථා ඇත. ( ල : 03 )

II.

- ඉස්ලාම් ජනතාවට විශේෂිත වූ උත්සවයකි.
- 'අල් කුර්ආනය' ලොව පහල වූ කාලය සිහිකිරීමට
- කුසගින්නේ කුරිරු බව දැන ගැනීමෙන් දිලින්දාට පිහිටවීමට
- යහපත් ආකල්ප වර්ධනය කර ගැනීමට

( ල : 2 × 2 = 04 )

III.

- දයාව, කරුණාව වැනි ගුණාංග වර්ධනය
- ඉවසීමේ ගුණය
- ඇඳුම් , පැළඳුම් වැනි ත්‍යාගයන් ලබාදීම තුළින් දානය වැනි ගුණාංග වර්ධනය
- යහපත් විනයක් පවත්වා ගැනීම
- බොරු කීමෙන් වැලකීම.

( ල :2 × 4 = 08 )

( 15 × 4 = 60 )